සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

88017

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2018**
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-........................................................ විභාග අංකයඃ-........................................................

සැලකිය යුතුයි.
- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. මහාවංසයේ මුල් කොටස රචනා කරන ලද්දේ
   1. බුද්ධඝෝෂ හිමි ය.
   2. මහානාම හිමි ය.
   3. ධාතුසේන රජතුමා ය.
   4. මහා පරාක්‍රමබාහු රජතුමා ය.

02. ක්‍රිස්තු වර්ෂ 2018 බුද්ධ වර්ෂවලින් සඳහන් වන පිළිතුර තෝරන්න.
   1. 544
   2. 1474
   3. 2500
   4. 2562

03. "පෘථිවිය සෑදී ඇත්තේ අහසේ තිබූ දූවිලි වලාකුළකින් බව විශ්වාස කරති." එවැනි දූවිලි වලා හැඳින්වෙන්නේ,
   1. ලාවා නමිනි.
   2. ප්‍රොකායොට් බැක්ටීරියාව නමිනි.
   3. නිහාරිකාව නමිනි.
   4. වල්ගාතරු නමිනි.

04. ● අදහස් හුවමාරු කර ගැනීමට හැකි භාෂාව
   ● හැඟීම් ප්‍රකාශ කිරීමට සංගීතය, නැටුම්, චිත්‍ර හැකියා

   ඉහත සඳහන් හැකියාවන් ප්‍රදර්ශනය කළ මානව වර්ගය වන්නේ
   1. හෝමෝ හැබිලිස් ය.
   2. හෝමෝ ඉරෙක්ටස් ය.
   3. හෝමෝ නියැන්ඩතාලෙන්සිස් ය.
   4. හෝමෝ සාපියන් ය.

05. ලෝකයේ පැතිරී ඇති අන්දම අනුව පහත රූපයෙහි ඇති ජන වර්ගය හඳුන්වන්නේ කුමන නමින්ද?
   1. කොකසොයිඩ්
   2. නීග්‍රොයිඩ්
   3. ඔස්ට්‍රලොයිඩ්
   4. මොන්ගොලොයිඩ්



06. මානව පරිණාමය ලෙස හැඳින්වූයේ

1. වානර පරම්පරාවට අයත් චිම්පන්සියෙකුගෙන් මිනිසෙකු බිහිවීමේ ක්‍රියාවලියයි.
2. මහා හිම යුගයේ මිනිසුන් බිහිවීමේ ක්‍රියාවලියයි.
3. සත්ත්ව පරිණාමය යි.
4. පෘථිවියේ ජීවීන් බිහිවීම යි.

07. දුනු-ඊතල භාවිතා කර දඩයම් කිරීම ආරම්භ වූයේ,

1. මහා හිම යුගයේදී ය.
2. පුරාශිලා යුගයේදී ය.
3. මධ්‍ය ශිලා යුගයේදී ය.
4. නව ශිලා යුගයේදී ය.

08. මිනිසුන් පළමු වරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි හමු වී ඇත්තේ

1. ඉන්දියාවෙන් ය. 2. අප්‍රිකාවෙන් ය. 3. ඊශ්‍රායලයෙන් ය. 4. චීනයෙන් ය.

09. නෙෆනෙෆවුටේන් නෙෆටිටී රජින සම්බන්ධ පහත් වගන්ති වලින් නොගැළපෙන වගන්තිය තෝරා ඉරක් අඳින්න.

1. පාරාවෝ රජෙකු වූ අක්හෙනතන්ගේ බිසවයි.
2. ඇගේ උඩුකය මූර්තිය ඇය මියගිය පසු නිර්මාණය කරන්නට ඇත.
3. ඇය විසින් කෙටි කලක් ඊජිප්තුව පාලනය කරන ලදී.
4. පුරාණ කාලයේ ජීවත් වූ රූමත්ම කාන්තාවක් ලෙස සැලකේ.

10. විජය ඇතුළු සත් සියයක් පිරිස මෙරටට ගොඩ බසින ලද ස්ථානය හැඳින්වෙන්නේ කුමන නමින්ද?

1. තම්බපණ්ණි. 2. සිරිසවත්ථුපුරය. 3. ලංකාපුරය. 4. මාතොට.

11. අප ආහාරයට ගන්නා බඩ ඉරිඟු මුල් වරට වගා කල ප්‍රදේශය වන්නේ,

1. අප්‍රිකාව යි. 2. මෙක්සිකෝව යි. 3. මධ්‍යධරණී ප්‍රදේශය යි. 4. චීනය යි.

12. මෙසපොතේමියානු ශිෂ්ටාචාර වැසියන් සුළඟට අධිපති දෙවියන් හැඳින්වූයේ මින් කුමන නමින් ද?

1. එන්ලිලි. 2. එන්කිකි. 3. අනු. 4. ඇතීනා.

13. ● සිගුරාට් නමින් හැඳින් වූ දේවාල
● ගංගාවල යාත්‍රා කරන කුඩා නැව් තැනීම

ඉහත සඳහන් නිර්මාණ ලොවට දායාද කළේ කුමන ශිෂ්ටාචාරයක වැසියන් ද?

1. චීන. 2. මෙසපොතේමියානු. 3. ඉන්දු නිම්න. 4. ඊජිප්තු.

14. පාරාවෝ රජ පෙළපත පිළිබඳ තොරතුරු හෙළිවන්නේ මින් කුමන ශිෂ්ටාචාරයේ ද?

1. චීන.
2. ඊජිප්තු.
3. ඉන්දු නිම්න.
4. මෙසපොතේමියානු.

15. මැටි පුවරුවක සකස් කරන ලද, ලෝකයේ පැරණිතම නීතිපොත සකස් කරන ලද පාලකයා කවුරුන් ද?

1. හමුරාබි. 2. ගිල්ගමේෂ්. 3. අක්හෙනතන්. 4. සාර්ගොන්.

16. පහත 'අ' තීරුව සහ 'ආ' තීරුව නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| අ | | ආ | |
|---|---|---|---|
| 1. | ථූපාරාමය ඉදිකිරීම | A | වළගම්බා රජතුමා |
| 2. | සෝමාරාමය ඉදිකිරීම | B | ධාතුසේන රජතුමා |
| 3. | ජේතවනාරාමය ඉදිකිරීම | C | දේවානම්පියතිස්ස රජතුමා |
| 4. | මහාපාළි දානශාලාව ප්‍රතිසංස්කරණය | D | මහසෙන් රජතුමා |

1. C A B D 2. A C D B 3. D B C A 4. C A D B

17. විජිතපුරය පිළිබඳ සඳහන් වැදගත් ඓතිහාසික සිද්ධිය මින් කුමක් ද?

1. සෝමා දේවිය සතුරන් අතට පත් වූ ස්ථානයයි.
2. ලහබත්ගේ නම් දානශාලාව ඉදිකළ ස්ථානයයි.
3. සඟමිත්තෙරණිය ඇතුළු පිරිස ගොඩබට ස්ථානයයි.
4. දුටුගැමුණු කුමරු හා එළාර රජු මුණගැසී සටන් කළ ස්ථානය යි.

18. වසභ රජතුමා විසින් ඉදිකරන ලද වැව් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. කලා වැව, යෝධ වැව 2. මින්නේරි වැව, හුරුළු වැව
3. මහවිලච්චිය වැව, මානන්කට්ටිය වැව 4. මානන්කට්ටිය වැව, තිසාවැව

19. ඉසිගිරි ඇමතිවරයා යාපනය ප්‍රදේශයේ පියංගුකතිස්ස නමින් විහාරයක් ඉදිකළ බව සඳහන් වී ඇත්තේ කුමන මූලාශ්‍රයක ද?

1. පනාකඩුව තඹ සන්නසෙහි ය. 2. වල්ලිපුරම් රන් පතෙහි ය.
3. ගල්පොත ශිලා ලිපියෙහි ය. 4. දීප වංසයෙහි ය.

20. මින්නේරි දෙවියන් නමින් ජනතාවගේ ගෞරවාදරයට පත් වූ රජතුමා කවුරුන් ද?

1. පණ්ඩුකාභය රජතුමා. 2. දුටුගැමුණු රජතුමා.
3. මහසෙන් රජතුමා. 4. ධාතුසේන රජතුමා.

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

01. A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



(i) A පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය කුමන රජුට අයත් ද?

(iii) මෙය සාදා ඇත්තේ කුමන ද්‍රව්‍යයකින් ද?

(iv) කුමන ශිෂ්ටාචාරයකට අයත් ද?

B



(i) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය කුමන යුගයට අයත්වේද?

(iii) මෙවා සකස් කිරීමට භාවිතා කර ඇත්තේ කුමන ද්‍රව්‍යයක් ද?

(iv) එම ද්‍රව්‍යයම යොදාගෙන ආදි මානවයින් තැනූ වෙනත් උපකරණයක් නම් කරන්න.

(2 X 8 = ලකුණු 16)

02. (i) ඉතිහාසය ඉගෙන ගැනීමට ප්‍රයෝජනවත් වන ප්‍රධාන මූලාශ්‍රය වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත දක්වා ඇති කාල නිර්ණය සඳහා වැදගත් වූ පුද්ගලයන් A, B, C, D අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - බුද්ධ වර්ෂ -

B - ශත වර්ෂ -

C - හිජ්රි වර්ෂ -

D - ක්‍රිස්තු වර්ෂ - (ලකුණු 04)

(iii) ඉතිහාසය හැදෑරීමෙන් ඇති ප්‍රයෝජන පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

03. (i) මීට අවුරුදු දසලක්ෂ පන්සිය හතළිස් දෙකකට පෙර ජීවත් වූ සතෙකුගේ පාෂාණ භූත සලකුණක් සොයාගෙන තිබේ.

A - මෙය සොයාගෙන ඇත්තේ කුමන රටකින් ද?

B - ඔහු හැඳින්වූයේ කුමන නමකින් ද? (ලකුණු 02)

(ii) පුරාශිලා යුගයේ මිනිසුන් ජීවත්වීම සඳහා උපයෝගී කර ගන්නා ලද ප්‍රධාන ක්‍රමෝපායන් දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දඩයම් කිරීම වෙනුවට ගොවිතැන් කිරීම ආරම්භ වීම නිසා මිනිසුන්ගේ ජීවන රටාව වෙනස් වූ ආකාරය හා ඔවුන් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පැවති ගංගා නිම්න දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) චීන ශිෂ්ටාචාර වැසියන් මුලින්ම ලෝකයට හඳුන්වා දුන් වටිනා දේවල් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙසපොතේමියානු ජන සමාජය සකස් වී තිබූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත්ව පැවති පැරණිතම ප්‍රධාන නගර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන් ඔවුන්ගේ නිර්මාණ තැනීමේ දී භාවිතා කළ ලෝහ වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ පහතු කරුණු ඇතුළත්ව කෙටි විස්තරයක් ලියන්න.
(නිවාස තැනූ ආකාරය, නගරවල පැවති ලක්ෂණ, ඔවුන්ගේ නිර්මාණ) (ලකුණු 05)

06. (i) පණ්ඩුකාභය රජුගේ මව හා පියාගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පණ්ඩුකාභය රජුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය නිර්මාණය කර ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලදැයි සැලකෙන නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දුටුගැමුණු රජතුමාගේ දක්ෂ සේනාපතිවරු සිවු දෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දුටුගැමුණු රජතුමාගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ තුළින් ඔබට ගත හැකි ආදර්ශ ඇතුළත් කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

For more past papers and exam resources,visit www.pastpaperszone.lk